# කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2018

**06 ශ්‍රේණිය** | **පුරවැසි අධ්‍යාපනය - I** | කාලය පැය 01 යි

නම: ........................................................................................ වි. අංකය: ............

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න'**
- **අංක 1 සිට 10 දක්වා ප්‍රශ්නවලට වඩාත්ම නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.**

1) ඖෂධවේදය පිළිබඳ මෙරට ප්‍රථම මහාචාර්යවරයා වූයේ,
   1) C.W.W.කන්නන්ගර මහතාය  2) සේනක බිබිලේ මහතාය
   3) නන්දදාස කෝදාගොඩ මහතාය  4) කාලෝ ෆොන්සේකා මහතාය

2) පාසල තුළ හොඳ ඉගෙනුම් වාතාවරණයක් ඇති කිරීම සඳහා.
   1) ගොඩනැගිලි පද්ධතියක් අවශ්‍යය  2) කාලසටහනක් අවශ්‍යය
   3) ගුරු මණ්ඩලයක් අවශ්‍යය  4) නීති පද්ධතියක් අවශ්‍යය

3) යමක් පාසලට අයත් බව ඇඟවීම සඳහා භාවිතා කරනුයේ.
   1) පාසලේ ලාංඡනය  2) පාසලේ ආදර්ශ පාඨය
   3) පාසල් කොඩිය  4) පාසල් ගීතය

4) හොඳින් ඉගෙනීමේ කටයුතුවල නිරත වීම, විනය ගරුක වීම, නීති ගරුක වීම, සෙසු ළමුන් සමග සමානාත්මතාවයෙන් කටයුතු කිරීම ඔබ සතු ,
   1) අයිතියකි  2) හිමිකමකි  3) යුතුකමකි  4) නීතියකි

5) පහත සඳහන් කරුණු අතරින් පාසලෙන් සමාජයට සැපයෙන සේවා ඇතුළත් පිළිතුරට යටින් ඉරක් අඳින්න.
   A යහපත් පුරවැසියන් බිහිකිරීම
   B පාසල සතු දේපල ආරක්ෂා කිරීම
   C අනාගත නායකයන් බිහිකිරීම
   D පාසලේ සංවර්ධන කටයුතුවලට සහාය වීම

   1) AB  2) AC  3) BD  4) BC

6) ශ්‍රී ලංකාවේ පරිපාලන බෙදීම් අනුව කුඩාම පරිපාලන ඒකකය වනුයේ
   1) දිස්ත්‍රික්කය  2) පළාත
   3) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය  4) ග්‍රාම නිලධාරි කොට්ඨාසය

7) බස්නාහිර පළාතට අයත් දිස්ත්‍රික්ක.
   1) දෙකකි  2) තුනකි  3) හතරකි  4) පහකි

8) උප්පැන්න සහතික නිකුත් කිරීම, ග්‍රාම සේවා සහතික අනුමැතිය ලබාදීම සේවාවන් ඉටුකරන රාජ්‍ය ආයතන.
   1) ග්‍රාම නිලධාරී කාර්යාලය  2) කලාප අධ්‍යාපන කාර්යාලය
   3) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය  4) ප්‍රාදේශීය සභා කාර්යාලය

9) සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ගයකි.
   1) ප්‍රතිචක්‍රීකරණය  2) අපද්‍රව්‍ය ගිනි තැබීම
   3) විකල්ප ද්‍රව්‍ය භාවිතය  4) රුක් රෝපණය

10) තම දුර්වලතා අවම කර ගැනීම සඳහා අනුගමනය කළයුතු ක්‍රියාමාර්ගයකි.
   1) තම දුර්වලතා හඳුනාගැනීම  2) අනුන්ගේ දුර්වලතා හඳුනාගැනීම
   3) තම දුර්වලතා වසා ගැනීම  4) අනුන්ගේ දුර්වලතා පෙන්වාදීම

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා තිත් ඉරමත ලියන්න.**

**(සම්ප්‍රදායයන්, ප්‍රාදේශීයසභා, සැලසුම්කරණය, සමිති සමාගම්, මිනිස් සමාජය)**

11) යම් කාර්යයක් වඩා ඵලදායී ලෙස කිරීම සඳහා කාර්ය කොටස් අනුපිළිවෙළකට කාල රාමුවක් ඇතුළත් ක්‍රියාත්මක කිරීම.................................................... නමින් හඳුන්වයි.

12) පාසලක කාලයක් තිස්සේ පැවැත එන සිරිත් විරිත් පිළිගැනීම් .................................................... ලෙස හඳුන්වයි.

13) මිනිසුන් සාමූහික ජීවිතයක් ගත කිරීම නිසා .................................................... ගොඩ නැගුණි.

14) ඔබ ප්‍රදේශයේ ජනතාව අතර අන්‍යෝන්‍ය සුහදතාව වර්ධනය කිරීම සහයෝගයෙන් හා සාමූහිකව කටයුතු කිරීම පොදු ගැටලු විසදා ගැනීමට සහාය වීම ආදි මෙහෙවර .................................................... මගින් ඉටුකරයි.

15) නගර සභාවට අයත් නොවන ග්‍රාමීය හා අර්ධ නාගරික ප්‍රදේශ .................................................... වේ.

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා තිත් ඉරමත ලියන්න.**

**(සම්ප්‍රදායයන්, ප්‍රාදේශීයසභා, සැලසුම්කරණය, සමිති සමාගම්, මිනිස් සමාජය)**

11) යම් කාර්යයක් වඩා ඵලදායී ලෙස කිරීම සඳහා කාර්ය කොටස් අනුපිළිවෙළකට කාල රාමුවක් ඇතුළත් ක්‍රියාත්මක කිරීම.................................................... නමින් හඳුන්වයි.

12) පාසලක කාලයක් තිස්සේ පැවත එන සිරිත් විරිත් පිළිගැනීම් .................................................. ලෙස හඳුන්වයි.

13) මිනිසුන් සාමූහික ජීවිතයක් ගත කිරීම නිසා .................................................... ගොඩ නැගුණි.

14) ඔබ ප්‍රදේශයේ ජනතාව අතර අන්‍යෝන්‍ය සුහදතාව වර්ධනය කිරීම සහයෝගයෙන් සාමූහිකව කටයුතු කිරීම පොදු ගැටලු විසදා ගැනීමට සහාය වීම ආදී මෙහෙවර .................................................. මගින් ඉටුකරයි.

15) නගර සභාවලට අයත් නොවන ග්‍රාමීය හා අර්ධ නාගරික ප්‍රදේශ .................................................. වේ.

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රකාශ හරිනම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.**

16) පාසලේ ඉතිහාසය පිළිබඳ තොරතුරු සොයා ගැනීමට උපකාරී වන සෑම දෙයක්ම **මූලාශ්‍ර** යනුවෙන් හඳුන්වයි. (　　)

17) තමන් තුළ ඇති දක්ෂතා අවස්ථානුකූලව පෙන්වා දීම ඔබ තුළ ආත්ම විශ්වාසය ගොඩ නැගේ. (　　)

18) අපේ රටේ පරිපාලන බෙදීම් අනුව කුඩාම පරිපාලන ඒකකය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයයි. (　　)

19) මිනිසාගේ බුද්ධිමය හා කායික හැකියා වැඩි දියුණු කර ගැනීමෙන් මානව සම්පතක් බවට පත් විය හැකිය. (　　)

20) පාසලේ ප්‍රජා සම්බන්ධතා මානව පැවතීමට පාසල සමාජයට විවෘත නොවිය යුතුය. (　　)

# පුරවැසි අධ්‍යාපනය - II

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතරු සපයන්න.**
- **පිළිතුරු ලිවිය යුතු  මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි**

---

1) i. තමන් සතුව පවතින යහපත් ගති ලක්ෂණ 2ක් ලියන්න (ලකුණු 2)
   ii. එම යහපත් ගති ලක්ෂණ පෙන්වා ඇති අවස්ථා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 4)
   iii. ඔබ තුළ පවතින දුර්වලතා දෙකක් ලියන්න. (ලකුණු 2)
   iv. එම දුර්වලතා අවම කර ගැනීම සඳහා ගත් ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 4)
   v. තමන් සතුව පවතින දක්ෂතා දෙකක් ලියන්න. (ලකුණු 2)
   vi. පාසලේ තම දක්ෂතා පෙන්වූ අවස්ථා දෙකක් නම් කරන්න. (ලකුණු 2)

2) i. පාසලේ පවතින පොදු නීතිරීති දෙකක් ලියන්න. (ලකුණු 2)
   ii. පාසලේ පවතින සම්ප්‍රදායයන් හතරක් ලියන්න. (ලකුණු 4)
   iii. පාසලක පවතින සම්ප්‍රධායයන් රැක ගැනීමේ ඇති වැදගත්කම කරුණු දෙකක් මගින් විස්තර කරන්න. (ලකුණු 5)

3) i. පාසල හා සම්බන්ධ පුද්ගල කණ්ඩායම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)
   ii. පාසලෙන් සමාජයට සැපයෙන සේවාවන් හතරක් ලියන්න. (ලකුණු 4)
   iii. "ළමා මිතුරු පාසල් " පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 5)

4) i. ඔබේ පාසලේ ආදර්ශ පාඨය ලියන්න. (ලකුණු 2)
   ii. පාසල් ලාංඡනය භාවිතා කරන අවස්ථා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 4)
   iii. "එක් පාසලක් විවෘත කිරීම සිර ගෙයක් වසා දැමීමට හේතු වනු ඇත" මින් අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 5)

5) i. ඔබේ නිවස පිහිටි දිස්ත්‍රික්කය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය නම් කරන්න. (ලකුණු 2)
   ii. ඔබ ප්‍රදේශයේ තිබෙන ස්වභාවික සම්පත් හතරක් නම් කරන්න. (ලකුණු 4)
   iii. ඔබ ප්‍රදේශයේ සිටින මානව සම්පත් දෙකක් සඳහන් කර එම සම්පත්වලින් ලබා ගන්නා ප්‍රයෝජන වෙන වෙනම පහත සඳහන් පරිදි දක්වන්න. (ලකුණු 5)

| මානව සම්පත් | ප්‍රයෝජන |
|---|---|
| 1 | |
| 2 | |

6) i. ඔබ ජීවත්වන ප්‍රදේශයේ මිනිසුන් සාමූහිකව කටයුතු කරන අවස්ථා දෙකක් ලියන්න.
(ලකුණු 2)

ii. සාමූහිකව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන හතරක් සඳහන් කරන්න. (ලකුණු 4)

iii. ඔබට සහයෝගය දක්වන රාජ්‍ය නිළධාරීන් පස්දෙනෙකු නම් කර ඔවුන්ගෙන් ඉටුවන සේවාවන් එක බැගින් වෙන වෙනම පහත සඳහන් පරිදි දක්වන්න. (ලකුණු 5)

| රාජ්‍ය නිළධාරීන් | සේවාවන් |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |

7) i. ඔබ ප්‍රදේශයේ ඇති විවිධ ආගමික සිද්ධස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 2)

ii. ආගමික සිද්ධස්ථාන මගින් ඉටුවන සේවාවන් හතරක් සඳහන් කරන්න. (ලකුණු 4)

iii. ඔබ ප්‍රදේශයේ ජනතාව එකතු වී පිහිටුවා ඇති සමිතියක් නම්කර ඉන් ඉටු කරනු ලබන සේවාවන් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 5)